# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2126/30 – 2019 ජුනි 04 වැනි අඟහරුවාදා – 2019.06.04

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය ගයන්ත කරුණාතිලක වන මම මෙයින් ප්‍රකාශ කරමි.

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, කුණ්ඩසාලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, උඩගම්පහ කෝරළේ සුළු කොට්ඨාසයේ, ලුණුකැටියාමඩිත්ත (709) ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, ලුණුකැටියාමඩිත්ත ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක මහ/කේඑන්ඩී/2018/144 හා 2018.07.31 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සවිස්තරව දැක්වෙන පහත සඳහන් නමින් සහ ප්‍රමාණයෙන් යුක්ත ඉඩම් කොටසට මායිම්:

01. කැබලි අක්ෂර 'ඒ' – **ලුණුකැටියාමඩිත්ත හේන – ප්‍රමාණය: හෙක්. 0.0124 ක් පමණ**

උතුරට: මාර්ගය සහ හිමිකම් කියන අය නොදන්නා ලුණුකැටියාමඩිත්ත හේන; නැගෙනහිරට: මාලනී ආරියරත්න හිමිකම් කියන ලුණුකැටියාමඩිත්ත හේන; දකුණට: මාලනී ආරියරත්න හිමිකම් කියන ලුණුකැටියාමඩිත්ත හේන සහ හිමිකම් කියන අය නොදන්නා ලුණුකැටියාමඩිත්ත හේන; බටහිරට: මාර්ගය.

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

මගේ අංකය: 4-3/9/2016/ඩබ්ලිව්එස්/528.
2019 අප්‍රේල් මස 09 වැනි දින.
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
"මිහිකත මැදුර",
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

06 – 547